ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

නීතිවේදී උපාධිය - 6 වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2006/2007

වාණිජ නීතිය - **LWU 3324/4324/4313**

කාලය - පැය 3 යි.

---

දිනය - 2007.03.23 වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.

වෙනත් අයුරකින් ප්‍රකාශිතව දක්වා නොමැති අවස්ථාවලදී ප්‍රශ්නයක උපකොටස් සඳහා සමාන ලකුණු ලැබෙන බව උපකල්පනය කළ යුතුය.

01. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ අවසන් වසර ශිෂ්‍යයෙකු වන අසේල, වතුර බෝතල් අලෙවි කිරීමේ යන්ත්‍රයක් **(water bottle vending machine)** කුලියට ගැනීමට සීමාසහිත ශ්‍යාම්රාජ් සමාගම සමඟ කුලී සින්නක්කර ගිවිසුමකට ඇතුළත් විය. නාවල, විවෘත විශ්වවිද්‍යාලය අසල පිහිටි තම වෙළඳසැලේ මෙම යන්ත්‍රය සවිකර ඉන් ලැබෙන ලාභය තම මිතුරකු විසින් පිටිසර ගමක ඉදිකරගෙන යනු ලබන පන්සලකට පිරිනැමීමට ඔහු අදහස් කළේය. 2006 අගෝස්තු 01 වන දින අසේල මෙ යන්ත්‍රය තම ව්‍යාපාරික ස්ථානයේ සවිකරන ලදී.

පහත සඳහන් අවස්ථාවන්හිදී විවිධ පාර්ශ්වකරුවන්ගේ අයිතිවාසිකම් සහ වගකීම් සලකා බලන්න.

(අ) අවාසනාවන්ත ලෙස 2006 සැප්තැම්බර් මාසයේ සිට මෙම යන්ත්‍රය අක්‍රමවත්ව ක්‍රියා කිරීමට පටන්ගත් අතර අසේල විසින් එම දෝෂය නිවැරදි කරදෙන ලෙස බොහෝ වාරයක් සමාගමෙන් ඉල්ලා සිටිය ද එකී සමාගම ඒ සඳහා කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ආ) අපේක්ෂිත ලාභය ඉපයීමට අසේලට නොහැකි වූ නිසා මාස තුනක වාරික ගෙවීම පැහැර හැරිණි. ගිවිසුමට අනුකූලව ගෙවිය යුතු හිඟ කුලී මුදල වන රු. 12,000/- දින හතක් තුළ නොගෙවන්නේ නම් එම මුදල අය කර ගැනීම සඳහා පියවර ගන්නා බව සමාගම විසින් අසේලට දැනුම් දෙන ලදී. එකී මුදල ගෙවීමට අසේල අපොහොසත් විය. සමාගම යන්ත්‍රය අත්පත් කරගෙන එය විකුණා දමන ලදී.

(ඇ) කුලී සින්නක්කර මිලෙන් 75% ක් අසේල විසින් ගෙවා තිබියදීත් සමාගම යන්ත්‍රයෙහි සන්තකය නැවත අත්කර ගන්නා ලදී.

(ඈ) 'යන්ත්‍රයේ සන්තකය නැවත ලබාගැනීම සඳහා කුලියට ගන්නාගේ නිවසට ඇතුල්වීමේ අයිතිය සමාගම සතුවේ.' යන වගන්තියක් ගිවිසුමට ඇතුළත් විය.

02. ලෝහිත, සුප්‍රසිද්ධ 'ලෝහිත් බාස්මතී ' සහල් සිල්ලර වෙළෙඳුන්ට සපයනු ලබන තොග වෙළෙන්දා වේ. 'ලෝහිත් බාස්මතී ' සහල් විකිණීම සඳහා 2007 ජනවාරි 23 වන දින පහත සඳහන් ගිවිසුම්වලට එළැඹෙන ලදී.

(අ) පළමු ශ්‍රේණියේ 'ලෝහිත් බාස්මතී' (ඉතා උසස් තත්වයේ) සහල් මිටි 200 ක් වේනූෂාට විකිණීමට ලෝහිත එකඟ විය. සහල් රැගෙන යාමට එන අවස්ථාවේදී මිල ගෙවීමට වේනූෂා එකඟ විය. සහල් මිටි 200 ක් වෙන් කළ ලෝහිත ඒවා වේනූෂාගේ නමින් ලේබල්කොට සහල් රැගෙන යාම සඳහා සූදානම් බව වේනූෂාට දැන්වීය. කෙසේ වුවද වේනූෂා වෙනුවෙන් වෙන්කර තිබූ සහල් මිටි ගබඩා කරන ලද ගබඩාවේ ගබඩාකොටස විදුලි පරිපථයේ දුර්වල නඩත්තුව නිසා ඇතිවූ ගින්නකින් විනාශ විය. මේ වන විටත් වේනූෂා තම සහල්මිටි රැගෙන ගොස් නොතිබිණි. පසුදින සහල් තොගය ගෙනයාමට පැමිණි වේනූෂාට සිදුවූ දෙය පිළිබඳව ලෝහිත පවසන ලද අතර තමන් සම්බන්ධයෙන් සලකනවිට එම සහල් තොගය වේනූෂාගේ වූ බැවින් ඒ සඳහා මිල ගෙවන ලෙස කීවේය. වේනූෂා මිල ගෙවීම ප්‍රතික්ෂේප කරයි.

වේනූෂාට එරෙහිව ඇති තම අයිතිවාසිකම් පිළිබඳව ලෝහිතට උපදෙස් දෙන්න.

(ආ) පළමු ශ්‍රේණියේ "ලෝහිත් බාස්මතී" සහල් මිටි 150 ක් හේරත්ට විකිණීමට ලෝහිත එකඟ විය. සහල් නියැදියක් පරීක්ෂා කරන ලෙස ලෝහිත හේරත්ගෙන් ඉල්ලා සිටියේය. එහෙත් ඔහුට තමන්ගේ ගනුදෙනුකරුවකු සමග තම ජංගම දුරකථනයෙන් වැදගත් ව්‍යාපාරික සාකච්ඡාවක් කරමින් සිටි බැවින් එය කළ නොහැකි විය. තමන් මිලදීගත් සහල් , නියැදිය තරම් යහපත් තත්වයේ නොමැති බව වටහාගන්නා හේරත් ලෝහිතට දෙන ලද චෙක්පත ප්‍රතිනියෝග **(countermand)** කරන ලදී.

ලෝහිතට එරෙහිව ඇති තම අයිතිවාසිකම් පිළිබඳව හේරත්ට උපදෙස් දෙන්න.

(ඇ) පළමු ශ්‍රේණියේ 'ලෝහිත් බාස්මතී' සහල් මිටි 300 ක් චමිලට විකිණීමට ලෝහිත එකඟ විය. මේවා මාසිකව මිටි 100 බැගින් සමාන සති වාරික ලෙස චමිලට යැවීමට ද ලෝහිත එකඟ විය. එකඟ වූ සහල් තොගයෙන් අඩක් චමිලට බාරදීමෙන් පසුව හා ඒ සඳහා ගෙවීම සිදු කිරීමෙන් පසුව සහල් මිටිවලින් සමහරක් පළමු ශ්‍රේණියේ නොව දෙවන ශ්‍රේණියේ ඒවා බවත් ඒවා ප්‍රතික්ෂේප කළ හැකිව තිබූ බවත් චමිල සොයා ගත්තේය. එබැවින් ඉදිරි බාරදීම්, බාරගැනීමට චමිල ප්‍රතික්ෂේප කළේය.

ලෝහිතට එරෙහිව ඇති තම අයිතිවාසිකම් පිළිබඳව චමිලට උපදෙස් දෙන්න.

(ඈ) දෙවන ශ්‍රේණියේ 'ලෝහිත් බාස්මතී ' සහල් මිටි 500 ක් ලෝහිතගෙන් මිලදී ගැනීමට ලාල් එකඟවූයේ එම සහල් මිටි 2007 ජනවාරි 30 වන දින ජයවර්ධනට විකිණීමේ බලාපොරොත්තු වෙනි. 2007 ජනවාරි 29 දිනට හෝ එදිනට පෙර ලෝහිත විසින් එම සහල් තොගය ලාල්ගේ වෙළඳසැල වෙත බාරදිය යුතු විය. එහෙත් විවිධ දුෂ්කරතා හේතුවෙන් ඒවා යැවීමට හැකිවූයේ 2007 පෙබරවාරි 10 වන දිනයි.

ලෝහිතට එරෙහිව තමන්ට ඇති අයිතිවාසිකම් පිළිබඳව ලාල්ට උපදෙස් දෙන්න.

03. "ශ්‍රී ලංකා නීතිය යටතේ පිළිගෙන තිබෙන සියළුම ගනුදෙනු කළහැකි සාධන පත්‍ර පැවරිය හැක්කේ ය. එහෙත් එම සාධනපත්‍ර අනෙකුත් පැවරිය හැකි ලේඛණවලින් කැපී පෙනෙන ලෙස වෙනස් වන්නේ ගනුදෙනු කළහැකි සාධන පත්‍ර පිළිබඳව පොදුවේ හඳුනන ලක්ෂණ නිසා පමණක් නොව, පාර්ශ්වකරුවන්ගේ අයිතිවාසිකම් හා යුතුකම්, භාවිතය පහසු කරවන විශේෂ ලක්ෂණ සහ ඒවායේ පාර්ශ්වකරුවන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කරන්නා වූ යාන්ත්‍රණය යනාදී සුවිශේෂී ලක්ෂණ නිසා ය."

ඉහත ප්‍රකාශයේ වලංගුභාවය නඩුතීරණ සහ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන ඇත්නම් ඒවා කෙරෙහි අවධානය යොමු කරමින් අගයන්න.

04. (අ) "සාමාන්‍යයෙන්, හානිපූරණ රක්ෂණය සහ සම්භාව්‍යතා රක්ෂණය සැලකිය යුතු ලෙසින් එකිනෙකින් වෙනස් වේ."

අදහස් දක්වන්න.

(ආ) ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ රක්ෂණ සමාගමකට ඉදිරිපත් කිරීම සඳහා යෝජනා පත්‍රයක් සකසන රංජිත්ට කරුණු කිහිපයක් පිළිබඳව පැහැදිලි කර ගැනීමට ඔබගේ සහය අවශ්‍ය වී තිබේ. පළමුව තම පෙම්වතියගේ ජීවිතය වෙනුවෙන් රක්ෂණ ආවරණයක් ලබාගත හැකි ද යන්නත්, දෙවනුව ඔහුගේ වෙළඳසැල වෙනුවෙන් ගිණි රක්ෂණ ආවරණයක් ලබාගෙන ඇති විටක වෙළඳසැලේ ගින්නකින් පසු ඉතිරිවන සුන්බුන් විකිණීමට හැකි වන්නේ ද යන්නත්, තෙවනුව තම යෝජනා පත්‍රයේ තමන් මත්පැන් පානය නොකරන බව සඳහන් කර තිබුණ ද , එහෙත් රක්ෂණ ගිවිසුමට එළැඹීමට පෙර තම පෙම්වතිය තමන් අතහැර යාම නිසා තමන්ට මද්‍යසාර භාවිතයට කිසිසේත් යොමු නොවී සිටීමට නොහැකිවීම නිසා මද්‍යසාර භාවිතයට යොමුවීම.

ඉහත අවස්ථා පැහැදිලිකර ගැනීමට රංජිත්ට සහයවීම ඔබගෙන් අපේක්ෂා කෙරේ. ඔබගේ පැහැදිලි කිරීම් නීත්‍යානුකූලව යුක්ති සහගත කළ යුතුවේ.

05. ගයංගාගේ 21 වන උපන්දින තෑග්ගක් ලෙස රු.1000/- ක චෙක්පතක් මනෝරි විසින් දෙන ලදී. ගයංගා එම චෙක්පතේ පිටුපස කිසිදු විධානයකින් තොරව තම අත්සන යෙදීය. අනතුරුව එය ශ්‍යාමේන්ට දුන්නේ ඇය විසින් ඇයගේ මිතුරෙකුගේ පුස්තකාල තැන්පතුව ගෙවීමට ගයංගාගෙන් ණය මුදලක් ඉල්ලා සිටි බැවිනි. ශ්‍යාමේන්ගෙන් එම චෙක්පත සොරාගත් බාලා ගයංගාගේ අත්සනට පූර්වයෙන් 'බාලාට ගෙවනු' යන්න එකතුකොට ඉන් තම ගෙවල් කුලිය ගෙවීය. බාලා පදිංචිව සිටින නිවසේ අයිතිකරුවන කමල් එය තම බැංකුවට ගෙන ගිය අතර කිසිදු ප්‍රශ්න කිරීමකින් තොරව බැංකුව විසින් ගෙවීම සඳහා එම චෙක්පත මනෝරිගේ බැංකුවට යවන ලදී.

පහත සඳහන් අවස්ථාවලදී බැංකුව ඇතුළු පාර්ශ්වකරුවන්ගේ අයිතිවාසිකම් සහ යුතුකම් සලකා බලන්න.

(අ) රේඛණය නොකරන ලද එම චෙක්පත මනෝරිගේ උපදෙස් මත අගරුකොට කමල්ගේ බැංකුව වෙත එවීමට පෙර කමල්ගේ බැංකුව විසින් රු.1000/- ක් ආපසු ගැනීමට කමල්ට ඉඩ දුනි.

(ආ) මනෝරි විසින් දෙන ලද චෙක්පත 'ආදායකගේ ගිණුමට පමණයි.' යනුවෙන් සඳහන් මුද්‍රිත පොදු ආකෘතියකට අනුව සකසන ලද එකක් නම්, ප්‍රතිවිරුද්ධ උපදෙස් නොලද මනෝරිගේ බැංකුව එම චෙක්පතේ මුදල් කමල්ගේ බැංකුවට ගෙවන ලද විටක.

(ඇ) මනෝරි විසින් දෙන ලද චෙක්පත 'මුදල් චෙක්පතක් ' නම් සහ බාලා විසින් එය රු.10,000 ක් ලෙසට පෙනෙන සේ වෙනස් කොට මනෝරිගේ බැංකුවේ කවුන්ටරය වෙත ඉදිරිපත් කළවිට බැංකුව ඒ සඳහා ගෙවීම සිදුකළ විටක.

06. (අ) සමන් ජයාගෙන් **'NEC-TAR'**නැමැති පළතුරුබීම බෝතල් 25 ක් ද කබ්රාල්ගෙන් අඟල් 21 වර්ණ රූපවාහිනියක් ද ගත්තේය. රූපවාහිනිය පාවිච්චි කරන ලද ක්‍රියාකාරිත්වයෙන් යුක්ත එකක් වන අතර ඇතැම් අළුත්වැඩියාවන් කිරීම අවශ්‍ය විය. සමන් මෙම භාණ්ඩ සඳහා මිල ගෙවීය. අලුත්වැඩියා කිරීමෙන් පසු රූපවාහිනිය සමන් විසින් පාවිච්චි කරන ලද අතර බීමවලින් තම ආගන්තුකයින්ට සංග්‍රහ කළේය.

කෙසේ වුවද, ජයා එම බීම බෝතල් සොරකුගෙන් මිලදී ගෙන ඇති බව සමන් අනාවරණය කර ගනී. එමෙන්ම රූපවාහිනී යන්ත්‍රය මිලදී ගන්නා අවස්ථාවේදී කබ්රාල් විසින් රූපවාහිනියේ අයිතිකරුවන බියංකාගෙන් එය තාවකාලික පාවිච්චියට ගෙන තිබුණි. නමුත් කල් නොයවාම බියංකා විසින් එම රූපවාහිනිය කබ්රාල්ට තෑගි කොට තිබුන බවද සමන් දැන ගනී.

කබ්රාල්ට සහ ජයාට සමන් දන්වන්නේ තමන් එම ගිවිසුම් දෙකම අවසන් වූවාසේ සලකන බවත් ගෙවන ලද මිල ආපසු දෙන ලෙසත් ය.

ජයාට සහ කබ්රාල්ට උපදෙස් දෙන්න.

(ආ) "භාණ්ඩ විකිණීමේ ගිවිසුමක, මිලදී ගන්නා ලද භාණ්ඩ 'කාර්යය සඳහා සුදුසු බවට' හෝ 'වෙළඳමය ගුණයකින් යුතු බවට' ව්‍යංග කොන්දේසියක් නැත්තේය. එහෙත් යම්කිසි භාණ්ඩයක් සාමාන්‍යයෙන් මිලදී ගන්නේ කුමක් සඳහා ද එකී කාර්යය සඳහා සුදුසු වේනම් එහි වෙළඳමය ගුණය ඇත්තේය."

විනිශ්චිත නඩු තීරණ සහ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන ඇත්තේ නම් ඒවා කෙරෙහි අවධානය යොමු කරමින් ඉහත ප්‍රකාශයේ නිරවද්‍යතාවය කෙරෙහි අදහස් දක්වන්න.

07. විනිශ්චිත නඩු තීරණ හා ව්‍යවස්ථා ප්‍රතිපාදන අදාලවන විට ඒවා කෙරෙහි අවධානය යොමු කරමින් පහත සඳහන් ඒවා සන්සන්දනය කර වෙනස්කම් දක්වන්න.

(අ) කුලී සින්නක්කර ගිවිසුමක කුලියට ගන්නා සහ භාණ්ඩ විකිණීමේ ගිවිසුමක ගැණුම්කරු

(ආ) විනිමය බිල්පතක් සහ පොරොන්දු නෝට්ටුවක්

(ඇ) 1896 අංක 11 දරණ භාණ්ඩ විකිණීමේ ආඥාපනතේ 25 වන වගන්තිය සහ කුලී සින්නක්කර ගිවිසුමක්.

08. පහත සඳහන් ඕනෑම <u>දෙකක්</u> පිළිබඳ සටහන් ලියන්න.

(අ) කුලී සින්නක්කර ගිවිසුමක කොන්දේසි සහ ප්‍රතිඥාහාර

(ආ) විනිමය බිල්පතක් ඉදිරිපත් කිරීම.

(ඇ) සංශෝධිත 1980 අංක 26 දරණ ආහාර පනත

(ඈ) පාරිභෝගික කටයුතු පිළිබඳ සභාව

- හිමිකම් ඇවිරිණි. -